


## මෛත්‍රී ජනපතිතුමා සහ ශ්‍රීලනි පක්ශය.




මෙම ජනවාරි 8 වැනි දා ශ්‍රීලනි පාක්ශිකයෝත් එම පක්ශයට ලැදි වෙනත් පාක්ශිකයෝත් මෛත්‍රීපාලට විරුද්දව චන්දය දුන්හ. මෛත්‍රීපාල ජනපතිකමට පත්වූයේ එජාපාක්ශිකයනුත් එම පක්ශයට ලැදි

> **<u>ලෝහමය මෙවලමක් අතට දී 'දැන් ඉතින් දිවි ඇති තෙක් ඔබ ජනපති ම'යැය් කියු නැකතියන්ගේත්, 'ජනාදිපතිතුමනි, ඔබ නම් රජෙක් ජනාදිපතිතුමනි ඔබ නම් රජතුමෙක්' යනුවෙන් කියා තමා මුරුංගා අත්තකට නැංගූ ගැත්තන්ගේත් බහට රැවටී කල යුතු දේ නොකල නිසාත් නොකල යුතු දේ කල නිසාත් මහින්දට කිසි දා නොසිතූ - නුදුටු වලකට වැටෙන්නට සිදුවිය.</u>**

දකුනේ වෙනත් පාක්ශිකයෙනුත් උතුරේ දෙමල පාක්ශිකයෙනුත් නැගෙනහිර මුස්ලම් පාක්ශිකයනුත් නිසාය.

ඒ අනුව පසුගිය දෙසැම්බරයේ සිට මෛත්‍රීපාල ශ්‍රීලනි පක්ශයේ පසමිතුරෙකි. මහජන චන්දයකින් අගමැති/ජනපති කමට එන්නට නොහැකිබව දන්නා රනිල් ගේ උපාය සාර්තක විය. මහින්ද පාලන සමයේ සිදුවී ඇතැය් කියන නෙ-ාමනාකම්වලට වඩා, ඒ සමයේ අඩපන කරන ලද දෙමල-මුස්ලිම් බලය ඉස්මතු වීම එයට හේතු විය.

මෛත්‍රී ගත් 62ත්, මහින්ද ගත් 58ත් අතර වෙනස 4කි. ඒ 4 බෙලහීන වු දෙමල-මුස්ලිම් ජනයාගේ චන්දය්.

ලෝහමය මෙවලමක් අතට දී 'දැන් ඉතින් දිවි ඇති තෙක් ඔබ ජනපති ම'යැය් කියු නැකතියන්ගේත්, 'ජනාදිපතිතුමනි, ඔබ නම් රජෙක් ජනාදිපතිතුමනි ඔබ නම් රජතුමෙක්' යනුවෙන් කියා තම මුරුංගා අත්තකට නැංගූ ගැත්තන්ගේත් බහට රැවටී කල යුතු දේ නොකල නිසාත් නොකල යුතු දේ කල නිසාත් මහින්දට කිසි දා නොසිතූ - නුදුටු වලකට වැටෙන්නට සිදුවිය.

ශ්‍රීලනි පක්ශය හැර දමා එජා පක්ශයට හේත්තු වි තමා ජනපති වු පසු රනිල් අගමැති කරන බව පැවසූ මෛත්‍රීපාල එදා ම ශ්‍රීලනි පක්ශයෙන් නෙරපා දැමීමට තරම් නුවනක් මහින්ද ඇතුලු ශ්‍රීලනි පක්ශයේ නායකයන් නොවීමේ විපාක අද මුලු රටටම විදින්නට සිදුවී තිබේ.

'ගිය නුවන ඇතුන් ලවා වත් ඇද්දවිය නොහැකිය' යන කියමන මෙහි දී සනාත වී ඇත. මෛත්‍රීපාල තම විදායක බලය පාවිච්චි කරමින් මන්ත්‍රීන් 50ක් වත් නැති පක්ශයේ නායකයා අගමැති කමට පත් කෙලේ පැවති ආන්ඩුවේ අගමැතිවරයා ඇතුලු කැබිනට් මන්ඩලය විසුරුවා හැරීමෙන් අනතුරුව නොවේ.

චන්ද්‍රිකා ජනාදිපති තනතුර දරද්දී, රනිල්ගේ එජා පක්ශයේ ආන්ඩුවක් පැවතුනා නම්, මෛත්‍රීපාල ජනාදිපති තනතුරේ සිටිද්දී ශ්‍රීලනි පක්ශයේ ආ-න්ඩුවක් තිබීමේ වරද කුමක්ද ? කිසිදු වරදක් නැත. රනිල්ගේ රූකඩයක් වූ මෛත්‍රීපාලට රනිල් අගමැති නොකර සිටිය නොහැකිවිය. කවර විදියේ නොමනා කමක් කර හෝ තමා ජනපති කමට ඔසවා තැබූ රනිල්ට නය ගෙවිය යුතුය.

ජනවාරි 9 වැනි දා මහින්ද කල තකතීරු පාවා දීම එම කාරිය ඉටු කිරීමට ඔහුට අනුබලයක් විය. ශ්‍රීලනි පක්ශයෙන් පැන ගිය ශ්‍රීලනි පක්ශයට විරුදුව තරග වැදුනු තැනැත්තාට ශ්‍රීලනි පක්ශයේ සබාපතිකම පිලිගැන්වීම 50 ලක්ශයක් (58 ලක්ශය ම ශ්‍රීලනි පාක්ශිකයන් නොවේ) පමන වූ ශ්‍රීලනි පාක්ශිකයින් අතරමං කිරීමක් පාවා දීමක් නොවේද ?

සියල්ල සිදු වි හමාර ය. 'කුම්බල මර්ශි කේවා නං පූශො තුක්ක විඳ-පාං' යැ කියූ තම්බියා උම්බලකඩ හොරා කෑ බලලාට පොල්ලකින් ගසා ඌ මරා පොල්ල බිම ඇන ගෙන එයට පසු පස බර දී සිටි තම්බි මුදලාලියා සිහිවේ.

ශ්‍රීලනි පක්ශයේ පසමිතුරකුට එම පක්ශයේ සබාපතිකම පිරිනැමීම කලේත් , ඒ පිරිනැමීම සිනාවක් පා පිලිගැනීම කෙල්ත් 'රෙද්දකුත් ඇඳ ගෙන ද' යන ප්‍රශ්නය කෙනකුට ඇසිය හැකිය.



තම චන්ද දායකයින් අතරමං කොට උන්ට කොකා පෙන්නා වාසියක් දුටු විට පිල් මාරු කිරීම ජනපාලකයන් ගේ සිරිත බව සමරවිර, අනුර, පීරි ස්, දිසානායක යන ජනහිත කාමින් අපට පෙන්වා දී ඇත.

ගිය අවිරුද්දේ අග දී මෛත්‍රීපාල සතුරන් හා එකතුවීම පුදුමයක් නොවේ. තමා සිහිනෙන් පවා නොසිතූ තැනකට තමා ඔසවා තැබීමට තම සතුරන් ඉදිරිපත් වූ විට-ඔවින් විසින් අඹරන ලද ඉනා බේත් ගුලිය ගිලි විට එයට එකඟ නොවී සිටිය හැකිද ? අද මෛත්‍රීපාල ශ්‍රී ලංකා ජනාදිපති බව සැබෑය. එහෙත් මහින්ද ඉදිරියේත්, රනිල් ඉදිරියේත් ඔහු ගේ දෙපා වෙව්ලයි; දනහිස් පන නැති වෙයි.

අවිරුදු පහෙන් පසු නැවත ජනපති වීමේ, අදහසක් තමාට නැති බවත් තම පවුලේ කෙනකු ඒ සඳහා පෙල ගැස්වීමේ අදහසක් වත් තමාට නැති නැති බවත් මෛත්‍රීපාල කියා ඇති බව ඇසීමි.

මෙදා පාර තම හිසේ කඩා වැටුනු පරන පින යලි කිසි දාක කඩා නොවැටෙන බව - ඒදන්ඩ කඩා වැටී නා ගැනීමට යලි කිසි දාක ඉඩ නොලැබෙන බව ඔහු තේරුම් ගෙන ඇත.

ශ්‍රී ලංකා ජනාදිපති තමා වැනි චාම් නිහතමානී කෙනකු බව පෝප් තුමා කියා ඇති බව ඇසිමි. එහෙත් පෝප් තුමා තමා වැනි කෙනෙකැය් හෝ තමා පෝප් තුමා වැනි කෙනෙකැය් කටක් ඇර කියන්නට මෛත්‍රීපාලට හැකි ද?
එක්තරා දාර්ශනිකයකුට (මට ඒ නම මතක්කර ගත නොහැක) ඉතා රූමත් තරුනියකගෙන් යෝජනාවක් ඉදිරිපත් විය. දාර්ශනිකයාට ඇත්තේ කුස රජුගේ මෙන් විසුලු (විරූපී) මුහුනකි. 'ඔබගේ දාර්ශනික නුවනත් , මගේ රූමත්කමත් ඇති දරුවකු ඇත් නම් ?' ඒ යෝජනාවය්.

'එය කනපිට පෙරලී ඔබගේ නුවනත් මගේ මුහුනත් ඇති දරුවකු ලැබුනොත්.' ඔහුගේ උත්තරයය්. මෛත්‍රී - පෝප් කතාව එයට ගැලපේ ද?

(ප්‍රකට පුද්ගලයන්ට මහතා/මහත්මිය උවමනා නැති නිසා නොලීමි)

## ජාතික කොඩිය වෙනස් කිරීම

අපේ ජාතික ගීය දෙමල බාසාවට පරිවර්තනය කොට ගායනා කිරීම හරි යැය් සමහරු කියති.

ආන්ඩුවේ මැති ඇමති වරු ද ඒ අතර වෙති.

තාය්ලන්තයේ පාලි ගාතා ඒ සැටියෙන්ම කියනු අසා ඇත්තෙමි.

වෙනස් කල ජාතික කොඩියක් පෙලපාලියක ගෙන යෑම අනුමත කිරීම හෝ විරුද්ද වීම මගේ අදහස නොවේ. එය පෙලපාලියේ ගෙන ගිය අයගේ සිත පිරි සිදු නැති බව මම දනිමි. එහෙත්,

★ කඩුවක්, කොඩියක්, පන්දමක් අතැති සිංහයකු, කොටියකු, වඳුරකු ගේ රූපය සහිත කොඩියක් පෙලපාලියක ගෙන යා හැකි ද ?
★ මේ අපේ ජාතික කොඩිය යය් කියූ කෙනෙක් සිටිද්ද
★ නියම ජාතික කොඩියක තාර හෝ සායම් ගා විකෘති කිරීමක් සිදු වී ඇද්ද ? (සිංහල /දෙමල අකුරුවල තාර ගෑ යුගය)
★ මේ සිංහ රූපය සහිත කොඩියක් මිස අපේ ජාතික කොඩිය නොවේ යය් ඔවින් කීවොත් "නෑ මේක ජාතික කොඩියක් නොවැ" යය් කිව හැක්කේ කාටද ?

ශ්‍රී වික්‍රම "රාජසිංහ" රජුගේ "සිංහරාජ" කොඩිය අපේ ජාතික කොඩිය ලෙස පිලිගෙන ඇති නිසා කඩුවක් අතැති ව සිටින සිංහ රුව සහිත කොඩි ප්‍රදර්ශනය කිරීම තහනම් කල යුතුය. (ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජ වුයේ රාජාදි රාජසිංහ රජුගේ බිසෝවරුන් දෙදෙනකු වූ අලමේලු අම්මා හා රෙංගනායකි අම්මා ගේ සහෝදරයන් සත් දෙනාගෙන් එකකු වු 'කන්නසාමි' නමැත්තා ය)

## බෙන්ඩිගෝ සිංහල පන්තිය ඇරඹෙයි

වික්ටෝරියා භාෂා පාසලේ මෙල්බනයෙන් පිටත ප්‍රථම සිංහල පන්තිය පසුගිය අප්‍රේල් 21 වන දින බෙන්ඩිගෝ හිදී ආරම්භ විය. මේ එම අවස්ථාවේ දර්ශන කීපයකි.

දරුවන් අට දෙනෙකුගෙන් ආරම්භ කෙරුණ මෙම පන්තිය ඉදිරියටම පවත්වාගෙන යාම සඳහා අවම වශයෙන් දරුවන් 15 දෙනකුගේ සහභාගිත්වය අවශ්‍ය බව සිංහල භාෂා පාසලේ සංවිධායිකා හිමාලි කරුණාසේන මහත්මිය සන්නසට දන්වා සිටියා ය.

සන්නස පාඨක ඔබ සැමගේ සහය මේ සඳහා අවශ්‍ය ය. ඔබත් ඔබේ හිතවතුන් අතරට මෙම පණිවුඩය ගෙනයන්න.








විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com